**නාඋල ප්‍රාදේශීය සභාව - 2023**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාඋල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ පුස්තකාල පොත් වටිනාකම වූ රු.1,194,996 ක් ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවිමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබියයුතු ස්ථාවර තැන්පත් පොලී රු.133,971ක් ගිණුම්ගත කර නොතිබුණි . | -එම- | -එම- |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 571(3) | කාලය ඉකුත් වූ අවස්ථා 5 කට අදාල අත රැඳවුම් මුදල් රු.329,147 ක් වසර 05 කට ආසන්න කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | රැඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ අදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,767,494 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,695,089 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් | 1,596,527 | 1,612,982 | 2,521,221 | 1,321,068 | 1,697,527 | 1,638,913 | 1,695,172 | 2,229,307 |
| (ii) | කුලී | 2,224,200 | 1,108,250 | 1,029,180 | 854,225 | 2,714,200 | 2,161,930 | 2,266,710 | 775,155 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,655,000 | 2,014,985 | 2,014,985 | - | 1,770,000 | 1,461,000 | 1,461,000 | - |
| (iv) | වෙනත් ආදායම් ජල - | 3,000,000 | 3,205,548 | 2,943,948 | 1,054,902 | 1,500,000 | 1,918,172 | 2,197,505 | 793,302 |
| | එකතුව | 9,475,727 | 7,941,765 | 8,509,334 | 3,230,195 | 7,681,727 | 7,180,015 | 7,620,387 | 3,797,764 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් බදු** | | |
| වරිපනම් හිඟය රු.5,000 ක් ඉක්ම වූ වරිපනම් ඒකක 61 කින් ලැබිය යුතු රු.783,120 ක හිඟහිටි වරිපනම් ගාස්තු ආදායමක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි වරිපනම් ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාඋල ප්‍රාදේශීය සභාව සතු ජල යෝජනා ක්‍රම 04 හි ජලයේ ගුණාත්මකත්වය පිළිබඳ ජල සාම්පල් පරීක්ෂාවකින් තොරව, ජලය ජල පාරිභෝගිකයින්ට බෙදා හැර තිබූ අතර මේ සම්බන්යෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තිය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ඉදිරියේදී ජල මූලාශ්‍රවල ජල සාම්පල් පරික්ෂා කර ජලය පිරිපහදු කර පිරිසිදු පානීය ජලය පාරිභෝගිකයන්ට සැපයීමට කටයුතු කරන බව. | පිරිසිදු පානීය ජලය සැපයීමට කටයුතු කළ යුතුය . |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.12,995,456 ක් විය. ඉන් වසර 1 ත් වසර 5 ත් අතර කාල පරාසයක එකතුව රු.1,832,092 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂවල වටිනාකම රු.842,530 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අයකර ගැනිමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂයන් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | පලුදු වූ මාර්ග පිළිසකර කිරීම වෙනුවෙන් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබූ රු.91,400 ක මුදල අරමුණුගත කාර්යය සඳහා යොදවා නොතිබුණි. | ඉදිරියේදී මාර්ග පරික්ෂා කිරිමෙන් පසු ඉදිරිකටයුතු සිදුකරන බව. | තැන්පත් නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාවේ) 4(1) පනතේ වගන්තිය අනුව සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඌ අනුව වගන්තියට අනුව සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන හා එක් එක් ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව මත සභාව මඟින් තීරණය කර එය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේදී අදාල සමීක්ෂණ කටයුතු කඩිනමින් සිදු කිරිමට බලාපොරෝත්තු වන අතර අනුමත උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව තීරණය කර ගැසට් කිරිමටද බලාපොරොත්තු වන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නාඋල නගරයේ ස්ථාපිත කර ඇති හෝරා ස්ථම්භකය අක්‍රීය වී වසර 12ක පමණ කාලයක් ගතවී තිබූ නමුත් එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂිකව ටෙන්ඩර් කර එහි නඩත්තු කටයුතු අදාල ටෙන්ඩර් කරුවෙත භාර දීමටද අපේක්ෂා කරන බව. | අළුත්වැඩියා කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ආර්ථික අපහසුතා ඇති දරුවන්ට බෙදා දීම සඳහා මිලදීගෙන තිබූ රු.2,288,155 ක් වටිනා පොත් 6350 ක් වසරකට වැඩි කාලයක් සභාව තුල රඳවාගෙන තිබුණි. | අයදුම්පත් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට කඩිනමින් ඉදිරිපත් කර දරුවන්ගේ අවශ්‍යතාවය සඳහා පොත් බෙදා දීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියක් යටතේ කටයුතු කල යුතුය. |
| (ඊ) | මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ රු.16,419,722 ක වියදමක් දරා අඹන නගරයේ ඉදිකර තිබූ කඩ කාමර 10 විධිමත් පරිදි බදු ලබාදීමට නොහැකි වීම හේතුවෙන් මසකට රු.3,000 ක් බැගින් වසරක් සඳහා රු.360,000 ක බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි. | කඩ හිමියන් දෙදෙනකු මුදල් ගෙවා කඩ කාමර දෙකක් ගැනීමට ඉදිරිපත් වී ඇති බව. | විධිමත් ගිවිසුම් වලට එළඹ කඩ කුලී අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ පරීක්ෂාවේදී 2023 දෙසැම්බර් 31 දිනට තනතුරු 13 ක පුරප්පාඩු 20 ක් පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධව වරින් වර පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | අනුමත කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කළයුතුයි. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුබෙදුම් කර වෙන්දේසියේ විකුණන ලද ඉඩම් 4 කින් ප්‍රාදේශීය සභාවේ ප්‍රජා හා විනෝද කටයුතු වෙනුවෙන් වෙන් කර තිබුණු රූඩ් 6 පර්චස් 59.98 ක ඉඩම් කොටස් හඳුනාගෙන අයිතිය සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි . | පවරා ගැනිමේ කටයුතු ඉදිරියේදි සිදු කරන බව. | පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සභාව විසින් භුක්ති විඳින රු.102,500,000 ක වටිනාකමින් යුත් ඉඩම් කොටස් 22 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනිමේ කටයුතු ඉදිරියේදි සිදු කරන බව. | පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.6,311,373 ක වටිනාකමින් යුත් මෝටර් ශ්‍රේඩරයක හා යතුරු පැදියක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනිම සඳහා අදාල ලිපි ලේඛණ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව | පවරා ගැනීමට කටයුතු කල යුතුය. |